**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

උපදේශක චක්‍රලේඛය 2004 පුස 02 (අ)(සංශෝධිත 2024)

## පාසල් හා විද්‍යා පීඨ පුස්තකාලයන්හි "ඔක්තෝබර් - ජාතික කියවීමේ මාසය වැඩසටහන" ක්‍රියාත්මක කිරීම

### 01. හැඳින්වීම

2004 වසරේ සිට සෑම වර්ෂයකම ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය මගින් ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව 2024 ඔක්තෝබර් මාසයට යෙදෙන ජාතික කියවීමේ මාසයට සමගාමීව කියවීම ප්‍රවර්ධනය සඳහා **විශේෂ වැඩසටහන්** සහ **විශේෂ ව්‍යාපෘති** ක්‍රියාත්මක කරන මෙන් සියලුම පාසල් හා විද්‍යා පීඨ පුස්තකාලවලින් ඉල්ලා සිටිනු ලැබේ. **" ලෝකය ජයගෙන ඇත්තේ කියවන මිනිසුන්ය "** යන තේමාව පදනම් කරගනිමින් මෙම වසරේ ජාතික කියවීමේ මාසය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත ය .

### 02. ව්‍යාපෘති කමිටුව

මෙහිදී වැඩසටහන් සංවිධානය කිරීම සඳහා කියවීමේ මාසයේ ව්‍යාපෘති කමිටුවක් පත් කර ගැනීම වඩා සුදුසු වේ. දැනට පුස්තකාල කමිටුවක් තිබේ නම් එම කමිටුව මගින් හා පාඨක සමාජයේ සහභාගිත්වයෙන් මෙම කටයුත්ත සිදු කළ හැක. මේ සඳහා ප්‍රධාන මෙහෙයුම් කමිටුවක් පත්කර ගැනීම ද සුදුසු වන අතර එහි සංයුතිය පහත පරිදි විය යුතුය

- පීඨාධිපති / විදුහල්පති / නියෝජ්‍ය විදුහල්පති - කමිටු සභාපති
- පුස්තකාලයාධිපති/ගුරු පුස්තකාලයාධිපති /පුස්තකාල භාරකරු - කමිටු ලේකම්
- පීඨාධිපති / විදුහල්පති විසින් නම්කරන වෙනත් ගුරුවරු දෙදෙනෙක්
- ගුරු දෙගුරු සංගමයේ සාමාජික මහත්ම මහත්මීන් දෙදෙනෙක්
- ශිෂ්‍ය නියෝජිතයන් දෙදෙනෙක්

### 03. ක්‍රියාත්මක කළ හැකි විශේෂ වැඩසටහන්

- ඵලදායී හා කාර්යක්ෂම අන්තර්ජාල ගවේෂණය , අධ්‍යාපනික සාධිකාරි තොරතුරු ගවේෂණය සම්බන්ධයෙන් සිසු සිසුවියන් දැනුවත් කිරීම.
- පුස්තකාලය හා මෙතෙක් සම්බන්ධ වී නොමැති ශිෂ්‍ය ශිෂ්‍යාවන් හඳුනා ගෙන ඔවුන් සම්බන්ධ කර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සිසුන්ගේ නිර්මාණශීලී හැකියාවන් එළිදැක්වෙන නිර්මාණ ඇතුළත් සඟරා, බිත්ති පුවත්පත් එළි දැක්වීම.
- කියවීම් හා ඉගෙනුම් කව සංවිධානය කිරීම.
- විවිධ කියවීම් ප්‍රවර්ධන තරග සංවිධානය කිරීම.
- තිරසර සංවර්ධන ඉලක්ක (Sustainable Development Goals) සහ ඒවා සපුරාගැනීමට අදාළව ශිෂ්‍ය ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කිරීම.
- දරුවන්ගේ රසවින්දනය ඉහළ නැංවීම සඳහා රසවින්දනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පුස්තකාලයේ හොඳම පාඨකයා තේරීම.
- ගෘහ පුස්තකාල ආරම්භ කිරීම පිළිබඳව ශිෂ්‍ය ශිෂ්‍යාවන් දිරිමත් කිරීම
- ප්‍රජා තොරතුරු සේවා පිළිබඳව ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කිරීම.
- වෙනත් නිර්මාණශීලී කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් සිදු කිරීම.

## 04. අරමුදල්

මේ සඳහා විශාල වශයෙන් මුදල් යෙදවීම අවශ්‍ය නොවන අතර අරමුදල් සපයා ගැනීම පාසල් සංවර්ධන සමිති අරමුදල හා පුස්තකාල අරමුදල මඟින් සිදු කර ගැනීම සුදුසුය.

## 05. වාර්තාව සකස් කිරීම

සිදු කරන ලද සියලුම වැඩසටහන් පිළිබඳ පැහැදිලි ක්‍රමවත් වාර්තාවක් සකස් කර පීඨාධිපතිගේ/ විදුහල්පතිගේ නිර්දේශය සහිතව ***2025 පෙබරවාරි මස 28*** වන දින හෝ ඊට පෙර ***අංශ ප්‍රධාන, ව්‍යාප්ති සේවා අංශය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අංක 14, නිදහස් මාවත, කොළඹ 07*** යන ලිපිනයට එවිය යුතුය.

ජයග්‍රාහී පුස්තකාල තෝරා ගැනීම සඳහා මූලිකව සලකා බලනු ලබන වාර්තාව සකස් කිරීමේදී, ඉහත දක්වන ලද වැඩසටහන් ඇතුළුව කියවීම ප්‍රවර්ධනය සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩසටහන් සඳහා පමණක් ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලැබේ. මුළු ලකුණුවලින් 75% ක් පුස්තකාලය විසින් සිදු කරන කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ද වෙනත් වැඩසටහන් සඳහා 25% ක ලකුණු ප්‍රමාණයක් ද හිමිවේ.

වාර්තාව සකස් කිරීමේදී පිටකවරය /පොතේ බැම්ම වැනි දේ සඳහා අමතර කාලයක් හා මුදලක් වැය කිරීම අවශ්‍ය නොවේ.පුස්තකාලය විසින් ජාතික කියවීමේ මාසයේ තේමාවට අනුව සිදුකරන ලද වැඩසටහන් සහ අදාළ වර්ෂය පුරා සිදුකළ වැඩසටහන්වල තොරතුරු වෙන් වෙන්ව **ඡායාරූප හා තහවුරු කළ හැකි වෙනත් සාධක සහිතව විධිමත් අයුරින්** ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය

## 06. ඇගයීම

ජාතික කියවීමේ මාසය 2024 ඵලදායි වැඩසටහන් ඉටු කළ පුස්තකාල වෙත 2025 ජාතික කියවීමේ මාසය සම්මාන ප්‍රදානෝත්සවයේ දී සම්මාන හා සහතිකපත් පිරිනැමීමට කටයුතු කරනු ලැබේ.ජයග්‍රාහී පුස්තකාල හා ඇගයීම් ලබන පුස්තකාල පිළිබඳ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

මහාචාර්ය නන්ද ධර්මරත්න
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, නිදහස් මාවත,
කොළඹ 07

මහාචාර්ය නන්ද ධර්මරත්න
සභාපති

විමසීම් - දුරකථන අංකය - 0112-688855
ෆැක්ස් - 0112685201
විද්‍යුත් තැපැල - libdev@mail.natlib.lk
වෙබ් පිටුව - www.natlib.lk